# ශ්‍රී ලංකාවේ ජාතික ගිණුම් පිළිබඳ විවර්ණිකාව 2006 පළමු කාර්තුව

ISSN 1391-7560

2006 ජුනි 14 | ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව | නවවැනි කලාපය

## ආර්ථික ක්‍රියාකාරීත්වය

❖ 1998 ස්ථාවර මිල ගනන් අනුව ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය, (ද. දේ. නි.) 2006 පළමු කාර්තුව තුල සියයට 7.0 ක ආර්ථික වර්ධන වේගයක් පෙන්නුම් කර ඇති අතර, 2005 වසරේ පළමු කාර්තුවේ දී එය සියයට 5 ක් විය.

❖ 2005 වසරේ පළමු කාර්තුව හා සැසඳමින් 2006 වසරේ පළමු කාර්තුවෙහි ආර්ථික ක්‍රියාකාරීත්වය සලකා බැලීමේ දී, සේවා අංශය සියයට 6.2 ක ද, කාර්මික අංශය සියයට 6.6 ක ද, කෘෂිකාර්මික අංශය සියයට 11.0 ක ද වර්ධන වේගයන්, පෙන්නුම් කොට ඇත.

❖ 2006 පළමු කාර්තුව සඳහා වූ ශ්‍රම බල සමීක්ෂණයෙන් අනාවරණය වන පරිදි සේවා නියුක්තියේ කෘෂිකර්ම අංශයේ 287000 කද සේවා අංශයේ 17,000 කද වැඩි වීම හා කාර්මික අංශයේ 10,000 ක අඩුවීම ඒ ඒ අංශ සඳහා වාර්තා වී ඇති ආර්ථික වර්ධනයයන් හා අනුරූප නැඹියාවක් පෙන්නුම් කරයි. 2006 පළමු කාර්තුවේ විරැකියා අනුපාතය වන සියයට 7.2 වාර්තා වී ඇති පහල අගයකි.

❖ දළ දේශීය නිෂ්පාදිතයේ සියයට 7.0 ක ආර්ථික වර්ධන වේගයට සේවා අංශය සියයට 48.1 කින් ද, කාර්මික අංශයෙන් සියයට 26.7 කින් ද කෘෂිකර්මාන්ත අංශයෙන් සියයට 25.2 කින් ද දායක වී ඇත. ඉතා අඩු මට්ටමකින් පැවති කෘෂිකර්මාන්ත අංශයේ දායකත්වය 2006 පළමු කාර්තුවේ ඉහළ දායකත්වය එහි කැපී පෙනෙන වර්ධනයක් ලෙස පෙන්නුම් කල හැක.

❖ දළ දේශීය නිෂ්පාදිතයට සේවා අංශයෙහි දායකත්වයේ ප්‍රමුඛතාවය මෑත කාලයේ දී ආර්ථිකයේ දක්නට ලැබුනු ප්‍රවණතාවයකි.

❖ දළ දේශීය නිෂ්පාදිතයට සේවා අංශය, එකතු කල අගය මත සියයට 55.0 කින් ද, සමස්ථ කාර්මික අංශය, එකතුකල අගය මත සියයට 28.8 ක් ද, කෘෂි අංශය සියයට16.2 කින් ද දායකත්වයක් 2006 පළමු කාර්තුවේ දී පෙන්නුම් කර ඇත.

❖ දළ දේශීය නිෂ්පාදිතයේ ගම්‍ය මිල දර්ශකයට අනුව 2006 ප්‍රථම කාර්තුවේ දී උද්ධමන අනුපාතය සියයට 6.9 ක් වන අතර එය 2005 වර්ෂයේ පැවති සියයට 10.4 ක උද්ධමනය හා සැසඳීමේ දී සැලකිය යුතු පහළ යාමක් පෙන්නුම් කරයි.

❖ සුනාමි ව්‍යසනයේ බලපෑම හේතු කොට ගෙන 2005 මුල් කාර්තුවේ දී ධීවර නිෂ්පාදනයෙහි හා සංචාරක ව්‍යාපාරයෙහි විශාල පසුබෑමක් ඇති විය. එහෙත් එම කර්මාන්ත යථා තත්ත්වයට පැමිණීම, 2006 පළමු කාර්තුවේ දී දක්නට ලැබේ.

**2006 පළමු කාර්තුවේ 7% ක ආර්ථික වර්ධනයේ සංයුතිය**




**ද.දේ.නි. ආංශික දායකත්වය**



2006 මුල් කාර්තුවේ දී ධීවර නිෂ්පාදනය සියයට 249.6 ක ඉතා ඉහළ ආර්ථික වර්ධන වේගයක් හා සංචාරකයින්ගේ පැමිණීම සියයට 27.5 කින් වර්ධනය වීම , මෙම තත්ත්වය පැහැදිලි කරයි.

## ආර්ථික වර්ධනයට බලපෑ හේතු

- 2005 වර්ෂය හා සැසඳීමේ දී 2006 ප්‍රථම කාර්තුවේ දී දළ දේශීය නිෂ්පාදිතයේ සියයට 7.0 ක වර්ධනය කෙරෙහි බලපෑ හේතු කිපයක් පහත දැක්වේ.

- සතුටුදායක දේශගුණික තත්ත්වය හා රජයේ යහපත් කෘෂිකාර්මික ප්‍රතිපත්තීන්ගේ එකතුවෙන් කෘෂිකාර්මික අංශයට ඉහළ ආර්ථික වර්ධන වේගයක් ලගා කර ගැනීමට හැකි විය.

- බාධක පැවතිය ද අවබෝධතා ගිවිසුම යටතේ පැවති සාමකාමී වාතාවරණය ආර්ථිකයේ වර්ධනයට ධනාත්මක බලපෑමක් සිදු කරන ලදි.

- බොරතෙල් මිල අඛණ්ඩව ඉහළ යාම උද්ධමනය ඉහළ යාමට හා විදේශ වෙළඳාම දුර්වල වීමට බලපා ඇති බව 2006 පළමු කාර්තුවෙහි ආනයන අපනයන දත්ත මගින් දක්නට ලැබේ.

## කෘෂිකර්මාන්ත අංශය

- 2005 වසරේ අග භාගයේ සහ 2006 වසරේ මුල් වකවානුවේ පැවති යහපත් කාලගුණ තත්ත්වය නිසා,කෘෂිකාර්මික අංශයේ ආර්ථික වර්ධනය සිත් ගන්නා සුළු අගයක් කරා ලගා වී ඇත. ඒ අනුව 2006 පළමු කාර්තුව සඳහා මෙම අංශය සියයට 11.0 ක වර්ධනයක්, දළ දේශීය නිෂ්පාදිතය තුල අත්කරගෙන ඇත.

2005 වසරේ දී පළමු කාර්තුව සඳහා කෘෂිකර්මාන්ත අංශය සියයට සෘණ 0.1 පසුබෑමකට ලක්ව පැවතුනි

- සාපේක්ෂ වශයෙන් ගත් විට, 1990 දශකයේ මුල් අවුරුදු වල සිට මේ දක්වා කෘෂි අංශයෙන් වාර්තා වී ඇති ඉහල වර්ධනයක් 2006 පළමු කාර්තුව තුල දක්නට ඇත. රජය විසින් කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාලව ගනු ලැබූ හිතකර ප්‍රතිපත්ති හේතුකොට ගෙන ඉහල ආර්ථික වර්ධනයක් කෘෂිකාර්මික අංශයෙන් ලබාගෙන ඇත.

- 2005 මුල් කාර්තුව තුල වී නිෂ්පාදනය සඳහා එකතු කල අගය සියයට 20.6 ක වර්ධනයක් අත්කරගෙන තිබේ. එසේ වුවත් 2006 වසරේ ද එම කාර්තුව සඳහා මෙම අගය සියයට 5.9 කින් තවදුරටත් වර්ධනය විය. පැවති යහපත් කාලගුණ තත්ත්වය, වත්මන් පොහොර සහනාධාර ප්‍රතිපත්තිය සහ සහල් ආනයන පාලන ප්‍රතිපත්ති මීට විශේෂ වශයෙන් දායක වී ඇති බව පෙනේ. පසුගිය මහ කන්නය සඳහා වපුරනු ලැබූ කුඹුරු බිම් ප්‍රමාණය ද සියයට 1.5 කින් වර්ධනය වී ඇත.

- තේ නිෂ්පාදනය 2006 පළමු කාර්තුවෙහි සියයට 6.0 කින් වර්ධනය වී ඇති අතර, 2005 වසරේ මුල් කාර්තුවේ දී පෙන්නුම් කොට ඇත්තේ සියයට 1.2 ක වර්ධනයකි.

- 2006 පළමු කාර්තුවේ දී රබර් නිෂ්පාදනය සඳහා එකතු කල අගය සියයට 17.3 ක වර්ධනයක් පෙන්නුම් කොට ඇති අතර 2005 වසරේ දී පැවති සියයට සෘණ 19.4 ක පසුබෑම අභිබවා මෙම වර්ධනය අත්කොට ගෙන ඇත.

**සංක්ෂිප්ත දර්ශක**

| | පළමු කාර්තුව | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2004 | ද.දේ.නි. දායකත්වය % | 2005 | ද.දේ.නි. දායකත්වය % | 2005/04 වර්ධන අනුපාතය | 2006@ | ද.දේ.නි. දායකත්වය % | 2006/05 වර්ධන අනුපාතය |
| **(අ) ස්ථාවර (1998) මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි) (රුපියල් බිලියන)** | **332,391** | **100.0** | **349,128** | **100.0** | **5.0** | **373,724** | **100.0** | **7.0** |
| i කෘෂිකර්මාන්ත | 54,654 | 16.4 | 54,590 | 15.6 | -0.1 | 60,608 | 16.2 | 11.0 |
| ii කර්මාන්ත අංශය | 94,251 | 28.4 | 100,879 | 28.9 | 7.0 | 107,496 | 28.8 | 6.6 |
| iii සේවා අංශය | 183,486 | 55.2 | 193,659 | 55.5 | 5.5 | 205,621 | 55.0 | 6.2 |
| **(ආ) පවතින වෙළඳ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි) (රුපියල් බිලියන)** | **509,392** | **100.0** | **590,632** | **100.0** | **15.9** | **676,096** | **100.0** | **14.5** |
| i කෘෂිකර්මාන්ත | 73,916 | 14.5 | 82,198 | 13.9 | 11.2 | 91,571 | 13.5 | 11.4 |
| ii කර්මාන්ත අංශය | 145,180 | 28.5 | 177,144 | 30.0 | 22.0 | 209,415 | 31.0 | 18.2 |
| iii සේවා අංශය | 290,296 | 57.0 | 331,289 | 56.1 | 14.1 | 375,110 | 55.5 | 13.2 |
| විනිමය අනුපාතය (ඇ. ඩො.1= රුපියල් ) | 98.0 | | 99.4 | | 1.4 | 102.3 | | 2.9 |
| **(ඇ) මිල දර්ශක** | | | | | | | | |
| i. ද. දේ. නි. මත පදනම් වූ ගම්‍ය මිල දර්ශකය (1998=100) | 153.3 | | 169.2 | | 10.4 | 180.9 | | 6.9 |
| ii. කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද.) 1952=100 | 3,453.2 | | 3,982.6 | | 15.3 | 4,267.8 | | 7.2 |
| iii. මහකොළඹ පාරිභෝගික මිල දර්ශකය (ම.කො.පා.මි.ද.) 1989=100 | 323.9 | | 373.6 | | 15.3 | 390.2 | | 4.4 |
| iv. ශ්‍රී ලංකා පාරිභෝගික මිල දර්ශකය (ශ්‍රීලං.පා.මි.ද.) 1995 - 1997=100 | 161.7 | | 189.5 | | 17.2 | 196.3 | | 3.6 |
| v. ආනයන ආයෝජන භාණ්ඩ ඒකක මිල දර්ශකය 1997=100 | 111.8 | | 122.0 | | 9.2 | 147.0 | | 20.4 |
| **(ඇ) බාහිර වෙළඳාම (වටිනාකම රුපියල් බිලියන)** | | | | | | | | |
| i. අපනයන භාණ්ඩ නැ.වි.ස. අගය | 133,578 | 26.2 | 152,493 | 25.8 | 14.2 | 155,465 | 23.0 | 1.9 |
| ii. ආනයන භාණ්ඩ මි.ර.ගැ. අගය | 179,039 | 35.1 | 191,922 | 32.5 | 7.2 | 235,719 | 34.9 | 22.8 |
| iii. ආයෝජන භාණ්ඩ (ගොඩනැගිලි ද්‍රව්‍යලවාහනල යන්ත්‍රසූත්‍ර සහ උපකරණ (මි.ර.ගැ. වටිනාකම) | 40,438 | 7.9 | 39,795 | 6.7 | -1.6 | 54,701 | 8.1 | 37.5 |

@යාවකාලික

- 2005 වසරේ පළමු කාර්තුවෙහි සියයට සෘණ 15.4 ක පසුබෑමකට ලක් වූ පොල් නිෂ්පාදනය සදහා වූ එකතු කල අගය, 2006 මුල් කාර්තුවේ දී සියයට 10.1 ක ඉහල වර්ධනයකට ලගා වී ඇත. සුනාමි ව්‍යසනයේ බලපෑම ද 2005 මුල් කාර්තුවෙහි පොල් නිෂ්පාදනයේ පසුබෑමට දායක වී ඇත.

- ගොඩගොවිතැන් වගාව , එලවළු හා පලතුරු ආදිය ඇතුලත් වෙනත් භෝග වගාවන් හි, ස්ථාවර මිල අනුව එකතුකල අගය සියයට 5.0 කින් 2006 පළමු කාර්තුවෙහි දී වර්ධනය වී ඇත. මෙම වර්ධනයට ගොඩගොවිතැන් වගාවෙහි හා එලවළු නිෂ්පාදනයෙහි වැඩිවීම හේතු වී ඇත.

- අපනයනයන් වැඩි වීම නිසාත් , යහපත් මිල ගණන් නිසාත්, එලවළු සදහා හොද වර්ධන අනුපාතයක් 2006 පළමු කාර්තුව සදහා හිමි වී ඇත.

## කර්මාන්ත අංශය

- 2006 වසරේ පළමුවන කාර්තුවේ දී නිෂ්පාදන කර්මාන්ත අංශය සියයට 4.9 ක් වූ මධ්‍යස්ථ වර්ධන අනුපාතිකයක් පෙන්නුම්කර ඇති අතර 2005 වසර සදහා එම අගය සියයට 5.4 ක් බව වාර්තා වී ඇත.

- කර්මාන්ත ශාලා නිෂ්පාදන අංශයෙහි ද සියයට 4.9 ක වර්ධන ප්‍රතිශතයක් වාර්තා වී ඇති අතර 2005 වසරේ දී එය සියයට 5.9 ක් විය.

- අපනයන සැකසුම් කර්මාන්ත අංශය සියයට 4.8 ක වර්ධනයක් 2006 පළමු කාර්තුව සදහා වාර්තා කර ඇති අතර 2005 වසර සදහා එය සියයට සෘණ 4.5 ක පසුබෑමක් විය.

- මෙම කාලය සදහා සමස්ථ කර්මාන්ත අපනයන ආදායම සියයට 3.6 කින් වර්ධනය වී ඇති අතර රෙදිපිළි හා ඇගළුම් අංශය සියයට සෘණ 1.6 ක පසුබෑමක් වාර්තා කොට ඇත. 2005 වසරේ මෙම කාලය සදහා එම අගයන් පිලිවෙලින් සියයට 12.1 ක් හා 7.4 ක් ලෙස පෙන්නුම් කර ඇත.

- පතල් හා කැනීම් අංශය 2005 වසරේ අදාල කාලය සදහා සියයට 15.2 ක වර්ධනයක් පෙන්නුම් කර ඇත. 2006 මුල් කාර්තුව සදහා එය සියයට 17.2 ක වර්ධනයක් පෙන්නුම් කර ඇත.

- විදුලිය, ගෑස් හා ජලය සියයට 11.2 ක වර්ධනයක් 2006 වසරේ පළමුවන කාර්තුව සදහා වාර්තා කර ඇති අතර 2005 වසරේ අදාල කාලය සදහා එය සියයට 15.9 කි.

- 2006 වසරේ පළමුවන කාර්තුව සදහා ඉදිකිරීම් අංශය සියයට 7.3 ක වර්ධනයක් ලබා ඇති අතර 2005 වසරේ මෙම කාර්තුව තුල එය සියයට 6.3 ක් ලෙස වාර්තා වී ඇත. (දේශීයව නිෂ්පාදන කල හා ආනයනික වශයෙන්) භාවිතයට ගත හැකි සිමෙන්ති ප්‍රමාණය සියයට 34.5 ක ඉහල වැඩිවීමක් පෙන්නුම් කර ඇත. 2005 වසරේ මෙම කාර්තුව සදහා එම අගය සියයට 19.8 ලෙස වාර්තා වෙයි.



## සේවා අංශය

- ❖ 2005 වසරේ පළමුවන කාර්තුව සඳහා සියයට 5.5 ක වර්ධන අනුපාතිකයක් වාර්තා කොට ඇති සේවා අංශය, 2006 එම කාර්තුව සඳහා සියයට 6.2 ක ඉහළ වර්ධන අනුපාතිකයක් වාර්තා කොට ඇත.

- ❖ 2006 වසරේ පළමු කාර්තුව සඳහා වෙළඳ අංශයේ ආනයන යටතේ එකතු වූ අගය සියයට 5.0 ක ප්‍රමාණයකින් වර්ධනය වී ඇත. වෙළඳාම හා සංනිවේදන අංශය ද 2006 පළමු කාර්තුව සඳහා සැලකිය යුතු වර්ධනයක් ලබා ඇත.

- ❖ 2006 පළමුවන කාර්තුව සඳහා සංචාරකයින්ගේ පැමිණීම සහ එහි ඉපැයීම් පිළිවෙලින් සියයට 27.5 සහ සියයට 108.1 ක් ලෙස වර්ධන වේගයක් වාර්තා කර ඇති අතර 2005 වසරේ එම කාල පරිච්ඡේදය සඳහා පිළිවෙලින් සියයට 5.0 ක හා සියයට 3.6 ක අඩු වර්ධන අනුපාතිකයන් පෙන්නුම් කර ඇත.

- ❖ 2005 සහ 2006 වසරවල පළමුවන කාර්තුව සඳහා මුළු ආනයන වටිනාකම (මි.ර.ගැ.) පිළිවෙලින් සියයට 7.2 සහ සියයට 22.8 ක වර්ධනයක් පෙන්නුම් කර ඇති අතර අපනයන වටිනාකම (නැ.වි.ස.) පිළිවෙලින් සියයට 14.2 සහ සියයට 1.9 ක වර්ධනයක් පෙන්නුම් කර ඇත.

- ❖ ආයෝජන භාණ්ඩ වල වටිනාකම 2006 පළමු කාර්තුවේ සියයට 37.5 ක වර්ධනයක් වාර්තා කොට ඇති අතර 2005 එම කාර්තුව තුල එම අගය සියයට සෘණ 1.6 ක් ලෙස වාර්තා වී ඇත.

## උද්ධමන අනුපාතය

- ❖ දළ දේශීය නිෂ්පාදිතයේ ගම්‍ය මිල දර්ශකය (1998=100 පාදක වසරට සාපේක්ෂව) 2005 වර්ෂයේ පළමු කාර්තුව සඳහා 169.2 ක් වූ අතර 2006 වර්ෂයේ පළමු කාර්තුවේ එම අගය 180.9 දක්වා වැඩි වී ඇත. කාර්තුමයවශයෙන්, දළ දේශීය නිෂ්පාදිතය මත පදනම් වූ සාමාන්‍ය උද්ධමන අනුපාතය 2005 වසරේ අගයට වඩා 2006 වසරේ අදාළ මිල උද්ධමන අගය අවම වී ඇත.

- ❖ 2005 පළමු කාර්තුවේ සාමාන්‍ය මිල උද්ධමන අනුපාතය වන සියයට10.4 ට සාපේක්ෂව 2006 හි මිල උද්ධමන අගය සියයට 6.9 ලෙස ඇස්තමේන්තු කර ඇත. බොරතෙල් මිල ඉහළ යාම නිසා ඉදිරි කාර්තුවේ මිල උද්ධමන අනුපාතය වැඩිවීමක් බලාපොරොත්තු විය හැකිය.

- ❖ ශ්‍රී ලංකා පාරිභෝගික මිල දර්ශකය ( පාදක වසර 1995/1997=100 අනුව) අනිකුත් පාරිභෝග මිල දර්ශකයන්ට වඩා, වඩාත් නියෝජනාත්මක නිරවද්‍ය දර්ශකයයි.

- ❖ ශ්‍රී ලංකා පාරිභෝගික මිල දර්ශකය මිල රැස්කිරීම සඳහා දිස්ත්‍රික්ක 20 ක් පමණ ආවරණය කරන අතර කොළඹ පාරිභෝගික මිල දර්ශකය සඳහා කොළඹ නගරය පමණක් ආවරණය කරයි. එම නිසා කොළඹ පාරිභෝගික මිල දර්ශකයට වඩා ශ්‍රී ලංකා පාරිභෝගික මිල දර්ශකය, පාරිභෝගික භාණ්ඩ වල මිල වෙනස්වීම වඩාත් හොඳින් නිරූපනය කරයි.

- ❖ වසර 2006 පළමු කාර්තුවේ කොළඹ පාරිභෝගික මිල දර්ශකය, මහකොළඹ පාරිභෝගික මිල දර්ශකය හා ශ්‍රී ලංකා පාරිභෝගික මිල දර්ශකය වැඩිවීම පිළිවෙලින් සියයට 7.2 ,4.4 හා 3.6 විය. 2005 වසරේ දී එම අගයන් පිළිවෙලින් සියයට 15.3 ,15.3 හා 17.2 ක වැඩිවීමක් පෙන්නුම් කර ඇත. ඒ අනුව මෙම මිල දර්ශක වලින් පාරිභෝගික භාණ්ඩ හා සේවා වලට සාපේක්ෂව අවම මිල වැඩිවීමක් පෙන්නුම් කර ඇත.

**රැකියා නියුක්ත පුද්ගලයින් සංඛ්‍යාව වෙනස් වීම**

**2006 පළමු කාර්තුව 2005 වර්ෂයට සාපේක්ෂව**

| අංශය | සංඛ්‍යාව | වෙනස |
|---|---|---|
| 01. කෘෂිකර්මය | 287,000 | වැඩිවීම |
| 02. කර්මාන්ත | 10,000 | අඩුවීම |
| 03. සේවා | 17,000 | වැඩිවීම |

# උතුරු නැගෙනහිර පළාත් හැර

**මූලාශ්‍රය : ශ්‍රමබල සමීක්ෂණය**




* උතුරු පළාත හැර ** මුලතිව් කිලිනොච්චි දිස්ත්‍රික්ක හැර *** සියලුම දිස්ත්‍රික්ක ඇතුලත්ව
Q1 # 2006 පළමු කාර්තුව - උතුරු නැගෙනහිර පළාත් හැර

**විමසීම් : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ජාතික ගිණුම් අංශය,**
**දු.ක. 2676345, 2676572 -ෆැක්ස් 2676572**
**ඊමේල්** national.accounts@statistics.gov.lk **අන්තර්ජාලය www.statistics.gov.lk**